සැ. යු. : 2025.03.28 දින පළ කරන ලද අංක 2430 ගැසට් පත්‍රයේ IV (ආ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,431 - 2025 අප්‍රේල් මස 04 වැනි සිකුරාදා - 2025.04.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 542 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 548 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අප්‍රේල් මස 25 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 අප්‍රේල් මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


539- B 082668 — 5,403 (2025/04)
F 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඦ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

### අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.-*** අ. පො. ස. (සා. පෙළ) හෝ ඊ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලුදෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2025 මැයි මස 05 වැනි දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2025 මාර්තු මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| අනුරාධපුරය | ගල්නෑව | කලන්කුට්ටිය කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ කළාගම් පළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය |
| අනුරාධපුරය | කැබිතිගොල්ලෑව | දකුණු කංචුට්ටු කෝරළය කොට්ඨාසයේ උප්පැන්න,මරණ සහ හුරුළු පළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය |

04-50

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### අංක 1877/27 දරන 2014.08.28 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාවේ 11.2 වගන්තිය යටතේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ පුරප්පාඩු පවතින විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ තනතුරුවලට පත් කිරීම සඳහා අංක 1877/27 දරන 2014 අගෝස්තු මස 28 දිනැති අති විශෙෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද, 1996/25 හා 2016 දෙසැම්බර් මස 06 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයෙන් සංශෝධනය කරන ලද, 2006.01.01 දින සිට බලාත්මක ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 11.2 වගන්තිය ප්‍රකාරව, 2025.05.02 දිනට 02 ඡේදය යටතේ දක්වා ඇති නියමිත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ දැනට සක්‍රිය සේවයේ නියුතු I ශ්‍රේණියට උසස් වීම් ලැබූ නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සැලකිය යුතුයි** : තනතුරට පත් කරන අවස්ථාවේ දී ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියට උසස් වී තිබීම අනිවාර්යය වේ.

01. පුරප්පාඩු සංඛ්‍යාව :

| *අනු අංකය* | *අමාත්‍යාංශය* | *තනතුර* | *පුරප්පාඩු ගණන* |
|---|---|---|---|
| 01 | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | අධ්‍යක්ෂ | 02 |

02. උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් :

| *අනු අංකය* | *දෙපාර්තමේන්තුව* | *තනතුර* | *සුදුසුකම* |
|---|---|---|---|
| 01 | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | අධ්‍යක්ෂ | එවකට පැවති අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශයෙහි, වර්තමාන විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ නිලධරයෙකු වීම;<br>*හෝ*<br>විශේෂ ශ්‍රේණියේ තනතුරකට පත්වීම් නොලද විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වීම;<br>*හෝ*<br>වර්තමාන විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ අදාළ සුදුසකම් සපුරා ඇති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයෙකු නොමැති අවස්ථාවල බඳවාගැනීමේ පටිපාටියේ 7.2.2.1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම්වන - |

| අනු අංකය | දෙපාර්තමේන්තුව | තනතුර | සුදුසුකම |
|---|---|---|---|
| | | | රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව පිළිබඳ පන්ති සාමාර්ථයක් සහිත විද්‍යාවේ දී විශේෂ උපාධියක් ලබා තිබීම ;<br>හෝ<br>රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව යන විෂයයන් සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමඟ එම විෂයයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම යන සුදුසුකම් සහිත ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයෙකු වීම. |

03. තනතුරු සඳහා තෝරා ගනු ලබන ක්‍රමය:

(i) ජ්‍යෙෂ්ඨතාව සහ කුසලතාව පදනම් කරගෙන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් එම කොමිෂන් සභාව විසින් අනුමත පහත දැක්වෙන ලකුණු පරිපාටියට අනුකූලව ලකුණු ලබා දෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිළිබඳ අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

04. ලකුණු පරිපාටිය :

| පරීක්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨතාව | | 50 |
| I.1. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා ලකුණු ලබා දේ.<br>➢ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා සඳහා උපරිම ලකුණු ප්‍රමාණය ලබා දෙනු ලැබේ.<br>➢ අනෙකුත් නිලධරයන් සඳහා ජ්‍යෙෂ්ඨතාවය = (ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු / ජ්‍යෙෂ්ඨතම නිලධරයාගේ I ශ්‍රේණියේ අමතර සේවා කාලය (අවුරුදු x12+මාස)) x අදාළ නිලධරයාගේ I ශ්‍රේණියේ අමතර සේවා කාලය (අවුරුදු x12+මාස) | 50 | |
| 2. කුසලතාව | | 50 |
| 2.1. ක්ෂේත්‍රයට අදාළ ව කේවල හෝ කණ්ඩායම් වශයෙන් සිදු කරන ලද;<br>I. පර්යේෂණාත්මක ප්‍රකාශන (Research Publications) –<br>➢ දේශීයව පලකරන ලද පර් යේෂණාත්මක ප්‍රකාශන ( Local Research Publications ) – එක් පරේය්ෂණාත්මක ප්‍රකාශනයක් සඳහා ලකුණු 02 බැගින් උපරිම ප්‍රකාශන 2ක් සඳහා | 04 | |
| ➢ ජාත්‍යන්තරව පලකරන ලද පර්යේෂණාත්මක ප්‍රකාශන ( International Research Publications ) – එක් පර්යේෂණාත්මක ප්‍රකාශනයක් සඳහා ලකුණු 03 බැගින් උපරිම ප්‍රකාශන 2ක් සඳහා | 06 | |
| II. සාරාංශ (Abstracts)<br>➢ ශ්‍රී ලංකාව තුළ (Local ) – එක් සාරාංශයක් සඳහා ලකුණු 02බැගින් උපරිම සාරාංශ 2ක් සඳහා) | 04 | |

| පරීක්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ➢ ජාත්‍යන්තර (International ) - එක් සාරාංශයක් සඳහා ලකුණු 2.5 බැගින් උපරිම සාරාංශ 2ක් සඳහා | 05 | |
| III. නිබන්ධන - එක් නිබන්ධනයක් සඳහා ලකුණු 04 බැගින් උපරිම නිබන්ධන 1ක් සඳහා (සැ.යු : දෙවන කාර්යක්ෂමතා කඩඉම හෝ I ශ්‍රේණියට උසස් වීමට සලකනු ලැබූ පශ්චාත් උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනය හැර වෙනත් නිබන්ධන සඳහා පමණක් ලකුණු ලබා දේ) | 04 | |
| IV. නව්‍යතා / නවෝත්පාදනයන් - එක් නව්‍යතා / නවෝත්පාදනයක් සඳහා ලකුණු 04 බැගින් උපරිම නව්‍යතා / නවෝත්පාදනයන් 2ක් සඳහා (අදාළ නිලධරයන්ගේ මූලිකත්වයෙන් සාර්ථකව ක්‍රියාත්මක වූ නවෝත්පාදනයන් බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තහවුරු කළයුතු වේ) | 08 | |
| V. පුවත්පත් / සඟරා ලිපි - එක් පුවත්පතක් / සඟරා ලිපියක් සඳහා ලකුණු 02 බැගින් උපරිම පුවත්පත් / සඟරා ලිපි 2ක් සඳහා | 04 | |
| VI. තෝරාපත් කරන තනතුරෙ හි කාර්ය භාරය සඳහා දායකත්වය දක්වන ආකාරය සම්බන්ධයෙන් පරිගණකය ආශ්‍රයෙන් සිදුකරනු ලබන විනාඩි 10ක ඉදිරිපත් කිරීම (Power Point Presentation)<br><br>I. අදාළත්වය (Relevancy) - ලකුණු 03<br>II. නිර්මාණශීලීත්වය / (Creativity ) - ලකුණු 03<br>III. ඒ සඳහා හඳුන්වාදෙන නව්‍යතා හා නව යෝජනා (Innovations & Suggestions) - ලකුණු 03<br>IV. කාල කළමනාකරණය (Time Management) - ලකුණු 03<br>V. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව (Proficiency in English) - ලකුණු 03 | 15 | |
| මුළු ලකුණු | | 100 |
| **සටහන -**<br><br>අ) ඉහත (v) නිර්ණායකය යටතේ ලකුණු ලබා ගත හැක්කේ අයදුම්කරු ඉංග්‍රීසි භාෂාව මගින් මෙම ඉදිරිපත් කිරීම සිදු කරන්නේ නම් පමණි.<br>ආ) ඉදිරිපත් කිරීමට අදාළ දෘඩ පිටපත (Hard Copy) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය. අමතර වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකසන ලද ඉදිරිපත් කිරීමේ දෘඩ පිටපතක් ද මෙම අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. | | |

05. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1877/27 දරන 2014 අගෝස්තු මස 28 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද ), ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාවේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට සිදුකර ඇති හෝ මින් මතු සිදු කෙරෙන හෝ සංශෝධනවලට ද යටත්ව, ඉහත කී සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව තෝරා ගනු ලබන නිලධරයන් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ පුරප්පාඩුව පවතින ඉහත තනතුරු සඳහා අදාළ තනතුරුවල රාජකාරි භාර ගන්නා දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ තනතුරුවලට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

06. මෙම නිවේදනයේ දන්වා ඇති අවම සුදුසුකම් සපුරාලන දැනට සක්‍රිය සේවයේ නිරත නිලධාරින් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

07. පහත ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ද සහිතව, ලියාපදිංචි තැපැලෙන්

2025.05.02 දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි "ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07" යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරෙහි " ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලබන අතර අයදුම්පත් අස්ථානගත වීම හෝ ප්‍රමාද වීම සම්බන්ධයෙන්වන පැමිණිලි භාර ගනු නොලැබේ.

08. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

09. අයදුම්පත්‍රය www.pubad.gov.lk ඔස්සේ ද බා ගත කළ හැකි ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. ආලෝකබණ්ඩාර,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2025 අප්‍රේල් මස 01 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ අධ්‍යක්ෂ තනතුරු සඳහා ඉල්ලුම් කිරීම

1. නිලධරයා සම්බන්ධ තොරතුරු
   i. සම්පූර්ණ නම: (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :...............................................................................
   ........................................................................................................................................
   (උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

   ii. මුලකුරු සමඟ නම: ( ඉංග්‍රීසි කැපිටල් අකුරින්)Mr./Mrs./Miss:................................................
   ........................................................................................................................................
   (උදා: GUNAWARDHANA, H. M. S. K.)

   iii. සම්පූර්ණ නම (සිංහලෙන්) : ........................................................................................

   iv. මුලකුරු සමඟ නම (සිංහලෙන්) ..................................................................................

   v. උපන් දිනය :.................................................................

   vi. අයදුම්පත භාර ගන්නා අවසන් දිනට වයස : අවු : ............., මාස : .............., දින : .................

   vii. ජාතික හැඳුනුම්පත් අංකය : ..............................

   viii. ස්ථිර ලිපිනය :.....................................................................................................
   ........................................................................................................................................

   ix. දුරකථනය අංක : කාර්යාලය : ........................... ජංගම :.......................................

   x. විද්‍යුත් ලිපිනය:......................................................................................................

2. තනතුර පිළිබඳ තොරතුරු :

   i. වර්තමාන සේවා ස්ථානය හා ලිපිනය : ....................................
   ii. III ශ්‍රේණියට පත්වීම් ලබා ඇති දිනය : ....................................
   iii. II ශ්‍රේණියට පත්වීම් ලබා ඇති දිනය : ....................................

iv. I ශ්‍රේණියට පත්වීම් ලබා ඇති දිනය : ....................................
v. දැනට දරන තනතුර : ....................................
vi. එම තනතුරට පත් වූ දිනය : ....................................

3. ජ්‍යෙෂ්ඨතාව :

| | | |
|---|---|---|
| 01 | අයදුම්පත් කැඳවන අවසාන දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය | |
| 02 | අයදුම්පත් කැඳවන අවසාන දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය | |
| 03 | වැටුප් රහිත නිවාඩු ලබා ඇති / නැති බව (වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම් ලබා ඇති දින සඳහන් කරන්න) | |

4. ක්ෂේත්‍රයට අදාළ සුදුසුකම් :

4.1. අදාළ ක්ෂේත්‍රය සඳහා දක්වන ලද විශේෂ දායකත්වය

| ❖ පර්යේෂණාත්මක හා ප්‍රකාශන | විස්තර | අදාළ වර්ෂය |
|---|---|---|
| පර්යේෂණාත්මක ප්‍රකාශන<br>I. දේශීයව පළකරන ලද පර්යේෂණාත්මක ප්‍රකාශන<br>II. ජාත්‍යන්තරව පළකරන ලද පර්යේෂණාත්මක ප්‍රකාශන | | |
| සාරාංශ<br>I. ශ්‍රී ලංකාව තුළ<br>II. ජාත්‍යන්තරව | | |
| නිබන්ධන | | |
| නව්‍යතා / නවෝත්පාදනයන් | | |
| පුවත්පත් ලිපි | | |

5. අයදුම්කරුගේ ප්‍රකාශය :

ඉහත සඳහන් තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය : ..............................

..........................................,
අයදුම්කරුගේ අත්සන.

II කොටස
( අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් සම්පූර්ණ කළයුතු වේ)
.................................................................................... අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ ................................................................................................................ මයා / මිය/ මෙනවිය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පතෙහි සඳහන් තොරතුරු පෞද්ගලික ලිපිගොනුවෙහි ඇති තොරතුරු අනුව නිවැරදිය / වැරදිය. ඔහුට / ඇයට විරුද්ධව විනය ක්‍රියාමාර්ග කිසිවක් නොමැති / ඇති බවත්, එවැනි ක්‍රියාමාර්ග ඉදිරියේ දී ගැනීමට අදහස් කර නොමැති / ඇති බවත්, අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 05 ක වැටුප් වර්ධක උපයාගෙන ඇති / නැති බවත්, කාරුණිකව දන්වා සිටිමි. ඔහුගේ / ඇයගේ අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.

........................................................,
අමාත්‍යාංශ ලේකම්ගේ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නිල මුද්‍රාව
දිනය

04-68

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරි තනතුර II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරි තනතුර II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය **2025 වර්ෂයේ ජූලි** මස පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.donets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams / E.B. Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 අප්‍රේල් මස 07** වැනි දින **පෙ.ව. 9.00**ට විවෘත වන අතර **2025 මැයි මස 05** වැනි දින **රාත්‍රී 9.00** ට අවසන් වේ.

දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාර දිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

1. මෙම නිවේදනයේ ''දෙපාර්තමේන්තු ප්‍රධානියා'' යනුවෙන් අදහස් කරනුයේ ආගමන හා විගමන පාලක ජනරාල්වරයා වේ. මෙම විභාගය මගින් බඳවා ගැනීම් සිදුකරනුයේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි තනතුරෙහි II ශ්‍රේණිය සඳහා වේ. වෙනත් ආකාරයකින් සුවිශේෂ කොට නොමැති අවස්ථාවන්හි දී ''තනතුර'' යන පදයෙන් අදහස් කරනුයේ බලයලත් නිලධාරි තනතුරෙහි II ශ්‍රේණිය වේ.

2. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2025.05.05** දින වේ.

   2.1. ලිඛිත විභාගය - මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර තුනකින් (03) කින් සමන්විත වේ.

   I. බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනුම
   II. ඉංග්‍රීසි භාෂාව
   III. පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම

   2.2. *විභාග දිනය* - මෙම විභාගය 2025 ජූලි මාසයේ කොළඹ දී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල්දැමීමට හෝ අවලංගු කිරීමට හෝ ආගමන හා විගමන පාලක ජනරාල්වරයාට බලය ඇත.

   2.3. සම්මුඛ පරීක්ෂණය -

   I. පුරප්පාඩු සංඛ්‍යාවෙන් 10% ක් පමණක් කාන්තා අයදුම්කරුවන් සඳහා වෙන් වේ.
   II. ආගමන හා විගමන පාලක ජනරාල්වරයා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින්, ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිට සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම අවම ලකුණු 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින්, පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ඉහත (i) හි දක්වා ඇති පදනමට අනුව ''ඉහළම ලකුණු ලබා ගන්නා'' අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ඇත. (සම්මුඛ පරීක්ෂණය සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් වේ.)
   III. සම්මුඛ පරීක්ෂණයේ දී පහත අංක 6.3 යටතේ දක්වා ඇති කායික සුදුසුකම් පරීක්ෂා කරනු ඇත.

3. පත් කරනු ලබන සංඛ්‍යාව 68 කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව අවසාන තීරණය ආගමන හා විගමන පාලක ජනරාල්වරයා විසින් ගනු ලබනු ඇති අතර, මෙම බඳවා ගැනීම්වල පත්වීම ක්‍රියාත්මක වන දිනය ද ආගමන හා විගමන පාලක ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබනු ඇත.

4. සේවා කොන්දේසි :

4.1. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද 2013.12.20 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත ඛණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරි තනතුර II ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීම් පටිපාටියේ නියමයන්ට හා කොන්දේසිවලට ද එම පටිපාටියට කර ඇති හෝ මින් මතුවට කෙරෙන්නා වූ සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු තනතුරෙහි II ශ්‍රේණිය සඳහා පත් කෙරෙනු ඇත.

4.2. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. එහෙත් නව පත්වීම්ලාභීන් හට පිරිනමනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට පත්වීම්ලාභීන් යටත් විය යුතුය.

4.3. අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත්ව බලයලත් නිලධාරි තනතුරේ II ශ්‍රේණියට බඳවා ගනු ලබයි. බඳවාගනු ලැබුවකු වසර තුන (03)ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියෙහි සඳහන් කර ඇති පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

4.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර පහක් (05) ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

5. මාසික වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

**රු. 58,660-10X1190-11X1360-15X1670- රු. 110,570 (MN-5/2025) වේ.**

එමෙන් ම වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

6. බඳවා ගැනීමේ සුදුසුකම් :

6.1. I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.
II. විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.
III. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.

6.2 අධ්‍යාපන සුදුසුකම් :

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම ; සහ
II. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

*සටහන* - උපාධිය බලපවත්වන දිනය සහ අ. පො. ස. සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමර්ථය ලැබූ දිනය සුදුසුකම් සපුරාලිය යුතු අවසාන දිනය වන 2025.05.05 දින හෝ ඊට පෙර දිනයක් විය යුතුය.

6.3 කායික සුදුසුකම් :

I. අයදුම්කරුවන්ගේ උස අවම වශයෙන් අඩි 5 අඟල් 4 (සෙ. මී. 162.5) ක් හා පපුවේ වට ප්‍රමාණය අඟල් 32 (සෙ. මී. 81.25) විය යුතුය.
II. අයදුම්කාරියන්ගේ උස අවම වශයෙන් අඩි 5 අඟල් 2 (සෙ. මී. 156) ක් විය යුතුය.

6.4 වයස :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු විසි එකට (21) නොඅඩු විය යුතු අතර, අවුරුදු තිස්පහට (35) නොවැඩි විය යුතුය. ඒ අනුව **2004.05.05 වැනි දිනට හෝ ඊට පෙර හා 1990.05.06 දිනට හෝ ඊට පසු** උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

7. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතුය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් ( Any Bank Credit Card )
II. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
III. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon).

*සටහන* :-

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

8. අයදුම් කිරීමේ ක්‍රමය :

8.1. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.2 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් විභාග දෙපාර්තමේන්තුව විසින් වෙබ් නිවේදනයක් පළකරනු ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම්කරු විසින් තමා අයදුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීමට හැකි වනු පිණිස අයදුම්කරුගේ ෆැක්ස් අංකය ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් අදාළ වෙබ් නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය මඟින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසීම් කිරීම වඩාත් ඵලදායී වනු ඇත. තව ද විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා අයදුම්කරු ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත සූදානම්ව තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

9. විභාගයට ඇතුළුවීම :

9.1. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබ ඇති අයදුම්කරුවන් සඳහා පමණක් විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. විභාග දින එම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකු හට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

9.2. අපේක්ෂකයන් විසින් තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර සෑම අපේක්ෂකයකු ම තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය එම විභාග ශාලාවේ දී පළමුවෙන් ම පෙනී සිටින දින එහි ශාලාධිපතිවරයා වෙත භාර දිය යුතුය. සෑම අපේක්ෂකයෙකු ම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රය ආරම්භයේ පළකර ඇත.

**සටහන -** විභාග අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, එම අපේක්ෂකයා විභාගයට ඉදිරිපත් වීම සඳහා හෝ තනතුරක් දැරීම සඳහා හෝ මෙම නිවේදනය මඟින් ඉල්ලා ඇති සියලුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු හට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ යන ඕනෑම අවස්ථාවක දී එම අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත.

12. අවශ්‍ය අවස්ථාවක දී, මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව ආගමන හා විගමන පාලක ජනරාල්වරයා විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. විභාගය පැවැත්වීම :

13.1. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

13.2. අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් උපාධිය ලබා ගත් භාෂාවෙන් ම හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතුය.

13.3. අපේක්ෂකයකු සුදුසුකම් ලත් උපාධියේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේ ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

13.4. ප්‍රධාන විෂයය එක් භාෂාවකිනුත් අතිරේක විෂයය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයෙන් සාමාර්ථ්‍යය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

**සටහන**

I. ඉහත 13.2 සහ 13.3 හි ඇති සුදුසකම් ලත් උපාධිය යන පදයෙන් අදහස් කෙරෙන්නේ 6.2 හි (i) ඡේදයේ ඇති උපාධි සුදුසුකම වේ.
II. අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින ඉංග්‍රීසි විෂයය ප්‍රශ්න පත්‍රය හැර, බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම සහ පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම යන ප්‍රශ්න පත්‍ර දෙකට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
III. තම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.

14. බඳවා ගැනීම් ක්‍රමය :

14.1. ලිඛිත විභාගය -

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර තුනකින් (03) යුත් ලිඛිත විභාගයක් පවත්වනු ලබයි. අපේක්ෂකයන් විසින් විභාගයේ සියලුම විෂයයන් සඳහා පෙනී සිටිය යුතුය. එම විෂයයන් සහ එක් එක් විෂයය සමත් වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ:

| විෂය අංකය | විෂයය | ලකුණු ප්‍රමාණය | සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය | කාලය පැය |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම | 100 | 40 | 2 |
| 02 | ඉංග්‍රීසි භාෂාව | 100 | 40 | 2 |
| 03 | පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම | 100 | 40 | 1 |

* විෂයය අංක 01 බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම විෂයය සඳහා කාලය පැය 01 බැගින් වූ ප්‍රශ්න පත්‍ර දෙකක් ඇතුළත් වේ.

14.2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

I. ඉහත අංක 6 යටතේ දක්වා ඇති බඳවා ගැනීම් සුදුසුකම් සපුරා තිබේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබයි. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබයි.

II. එක් එක් විෂයය සඳහා අවම ලකුණු හතළිහක් (40%) හෝ ඊට ඉහළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් අතරින් සියලු විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. එසේ සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින්, ලිඛිත විභාගයෙන් ඔවුන් විසින් ලබා ගත් කුසලතා අනුපිළිවෙල හා බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබයි. බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාවට සමාන සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හි දී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

**සැලකිය යුතුයි** - සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම, පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

14.3. පුරප්පාඩු සංඛ්‍යාව අනුව, සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත විභාගයේ දී ලබා ගත් ලකුණු සංඛ්‍යාව මත ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින් මෙම තනතුරට බඳවා ගනු ලැබේ.

14.4. ප්‍රතිඵල :
මෙම *ගැසට්* නිවේදනයේ 14.1 ඡේදය මඟින් දක්වා ඇති පරිදි, අපේක්ෂකයන් විභාගයේ දී ලබා ගන්නා මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය ආගමන හා විගමන පාලක ජනරාල්වරයා වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම හෝ සිදුකරනු ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

15. ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය :

01. බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම - කාලය පැය 02යි. ලකුණු 100යි.

1 වන කොටස - බුද්ධි පරීක්ෂණය
අපේක්ෂකයන්ගේ තර්කන ශක්තිය, ගණිතමය දක්ෂතා, අවබෝධය හා තීරණ ගැනීමේ හැකියාව මැනීම සඳහාවන ප්‍රශ්න පත්‍රයකි.

2 වන කොටස - සාමාන්‍ය දැනීම
මෑත භාගයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික, සාමාජීය හා දේශපාලන තොරතුරු, ලෝක දේශපාලනය, විද්‍යාව හා තාක්ෂණ ක්ෂේත්‍රවල දැනීම හා නව විද්‍යාත්මක සොයා ගැනීම් ආදිය පිළිබඳ අරමුණු කරන ලද කෙටි හා / හෝ බහුවරණ ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි.

02. ඉංග්‍රීසි භාෂාව - කාලය පැය 02 යි. ලකුණු 100 යි.

කියවීමෙන් අවබෝධය, ප්‍රකාශන හා සන්නිවේදන හැකියාව මැනීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

03. පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම, කාලය පැය 01 යි. ලකුණු 100 යි.

පරිගණක පිළිබඳ මූලික දැනීම, MS Word, MS Excel, වැනි මෘදුකාංග භාවිතය පිළිබඳ සහ Internet, e-mail භාවිතය පිළිබඳ දැනුම මැනීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

16. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යතයෙන් පළවා මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් හෝ නොගැළපීමක් වේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කළ යුතුය.

බී. එම්. ඩී. නිලූෂා බාලසූරිය,
ආගමන හා විගමන පාලක ජනරාල් (*වැ.බ.*),
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව.

2025 මාර්තු මස 27 වැනි දින
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
සුහුරුපාය,
බත්තරමුල්ල.

04-47/2

---

**මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ
බලයලත් නිලධාරි තනතුර II ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරි තනතුර II ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය **2025 වර්ෂයේ ජූලි මස** පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.donets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams / E.B. Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 අප්‍රේල් මස 07 වැනි දින පෙ.ව. 9.00** ට **විවෘත වන අතර 2025 මැයි මස 05 වැනි දින රාත්‍රී 9.00** ට අවසන් වේ.

නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

1. මෙම නිවේදනයේ “දෙපාර්තමේන්තු ප්‍රධානියා” යනුවෙන් අදහස් කරනුයේ ආගමන හා විගමන පාලක ජනරාල්වරයා වේ. මෙම විභාගය මගින් බඳවා ගැනීම් සිදු කරනුයේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි තනතුරෙහි II ශ්‍රේණිය සඳහා වේ. වෙනත් ආකාරයකින් සුවිශේෂ කොට නොමැති අවස්ථාවන්හි දී “තනතුර” යන පදයෙන් අදහස් කරනුයේ බලයලත් නිලධාරි තනතුරෙහි II ශ්‍රේණිය වේ.

2. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2025.05.05** දින වේ.

2.1. ලිඛිත විභාගය - මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර තුනකින් (03)කින් සමන්විත වේ.

I. බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනුම,
II. ඉංග්‍රීසි භාෂාව,
III. පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම.

2.2. විභාග දිනය - මෙම විභාගය **2025 ජූලි මස කොළඹ දී** පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල්දැමීමට හෝ අවලංගු කිරීමට හෝ ආගමන හා විගමන පාලක ජනරාල්වරයාට බලය ඇත.

2.3. සම්මුඛ පරීක්ෂණය :

I. පුරප්පාඩු සංඛ්‍යාවෙන් 10%ක් පමණක් කාන්තා අයදුම්කරුවන් සඳහා වෙන් වේ.

II. ආගමන හා විගමන පාලක ජනරාල්වරයා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින්, ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම අවම ලකුණු 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින්, පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ඉහත (i) හි දක්වා ඇති පදනමට අනුව "ඉහළම ලකුණු ලබා ගන්නා" අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ඇත. (සම්මුඛ පරීක්ෂණය සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් වේ.)

III. සම්මුඛ පරීක්ෂණයේ දී පහත අංක 6.3 යටතේ දක්වා ඇති කායික සුදුසුකම් පරීක්ෂා කරනු ඇත.

3. පත්කරනු ලබන සංඛ්‍යාව 45 කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව අවසාන තීරණය ආගමන හා විගමන පාලක ජනරාල්වරයා විසින් ගනු ලබනු ඇති අතර, මෙම බඳවා ගැනීම්වල පත්වීම ක්‍රියාත්මක වන දිනය ද ආගමන හා විගමන පාලක ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබනු ඇත.

4. *සේවා කොන්දේසි* :

4.1. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 වැනි දින දරන අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද 2013.12.20 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත ඛණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරි තනතුර II ශ්‍රේණිය සඳහාවන බඳවා ගැනීම් පටිපාටියේ නියමයන්ට හා කොන්දේසිවලට ද එම පටිපාටියට කර ඇති හෝ මින් මතුවට කෙරෙන්නා වූ සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු තනතුරෙහි II ශ්‍රේණිය සඳහා පත් කෙරෙනු ඇත.

4.2. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

4.3. එක් (01) අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ව බලයලත් නිලධාරි තනතුරේ II ශ්‍රේණියට බඳවා ගනු ලබයි. බඳවාගනු ලැබුවකු වසර තුනක් (03) ඇතුළත බඳවා ගැනීම් පටිපාටියෙ හි සඳහන් කර ඇති පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

4.4. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර පහක් (05) ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

5. *මාසික වැටුප් පරිමාණය* :

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

**රු. 58,660-10X1,190-11X1,360-15X1,670-රු.110,570 (MN-5/2025) වේ.**

එමෙන්ම වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

6. බඳවා ගැනීමේ සුදුසුකම් :

6.1.

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.
II. විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.
III. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.

6.2. අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

I. අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී ගණිතය, ඉංග්‍රීසි, සිංහල/ දෙමළ භාෂාව යන විෂයයන් ඇතුළුව අවම වශයෙන් විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථය සහිතව එක් වරක දී විෂයයන් හයක් (06) සමත් වී තිබීම;

*සහ*

අ. පො. ස. උසස්පෙළ විභාගයේ දී අවම වශයෙන් එක් (01) විෂයයක් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම ;

*සහ*

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරාලිය යුතු අවසාන දිනට රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත MN -1/2025 හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි තනතුරක වසර දහයකට (10) නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ;

*හෝ*

II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම ;

*සහ*

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරාලිය යුතු අවසාන දිනට රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත MN-1/ 2025 හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි තනතුරක වසර පහකට (05) නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සටහන -

I. උපාධිය බලපවත්වන දිනය සහ අ. පො. ස. සාමාන්‍ය පෙළ / උසස්පෙළ විභාගවලින් ඉහතින් අපේක්ෂිත සාමාර්ථය ලැබූ දිනයන් සුදුසුකම් සපුරාලිය යුතු අවසාන දිනය වන **2025.05.05** දින හෝ ඊට පෙර දිනයක් විය යුතුය.

II. ඉහත සඳහන් සේවා කාලය ගණනය කිරීමේ දී රාජ්‍ය සේවය සහ / හෝ පළාත් රාජ්‍ය සේවයන්හි අදාළ හා අඛණ්ඩ සේවා කාලයන් පිළිගනු ලැබේ.

6.3. කායික සුදුසුකම් :

I. අයදුම්කරුවන්ගේ උස අවම වශයෙන් අඩි 5 අඟල් 4 (සෙ. මී. 162.5) හා පපුවේ වට ප්‍රමාණය අඟල් 32 (සෙ. මී. 81.25) විය යුතුය.
II. අයදුම්කාරිණියන්ගේ උස අවම වශයෙන් අඩි 5 අඟල් 2 (සෙ. මී. 156) විය යුතුය.

6.4. වයස :

රාජ්‍ය සේවයෙහි දැනටමත් සේවයේ නියුතු නිලධාරීන් සඳහාවන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.

7. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදුකළ යුතුය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
II. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
III. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

සටහන :-

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරුකිරීමක් සිදු කරනු නොලැබේ.

8. අයදුම් කිරීමේ ක්‍රමය :

8.1 මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.2 විභාගය සඳහා ඉල්ලුම් කරන අවස්ථාව වනවිට පැවති අයදුම්කරුගේ තනතුර හා සේවා ස්ථානය විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළවන අතර අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් සිදුවන වෙනස්කම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

8.3 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් විභාග දෙපාර්තමේන්තුව විසින් වෙබ් නිවේදනයක් පළකරනු ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම්කරු විසින් තමා අයදුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීමට හැකිවනු පිණිස අයදුම්කරුගේ ෆැක්ස් අංකය ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක් අදාළ මෙම නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසීම් කිරීම වඩාත් ඵලදායී වනු ඇත. තව ද විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා අයදුම්කරු ළඟ තබාගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙ හි පිටපත සුදානම් ව තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

9. විභාගයට ඇතුළු වීම :

9.1 විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබ ඇති අයදුම්කරුවන් සඳහා පමණක් විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. විභාග දින එම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකු හට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

9.2 අපේක්ෂකයන් විසින් තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර සෑම අපේක්ෂකයකු ම තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය එම විභාග ශාලාවේ දී පළමුවෙන් ම පෙනී සිටින දින එහි ශාලාධිපතිවරයා වෙත භාර දිය යුතුය. සෑම අපේක්ෂකයකු ම අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළකර ඇත.

**සටහන** - විභාග අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, එම අපේක්ෂකයා විභාගයට ඉදිරිපත් වීම සඳහා හෝ තනතුරක් දැරීම සඳහා හෝ මෙම නිවේදනය මගින් ඉල්ලා ඇති සියලුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ :

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව තහවුරු කර ගතහැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු හට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ යන ඕනෑම අවස්ථාවක දී එම අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත.

12. අවශ්‍ය අවස්ථාවක දී, මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව ආගමන හා විගමන පාලක ජනරාල්වරයා විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. විභාගය පැවැත්වීම :

13.1. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.
13.2. අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතුය.
13.3. අපේක්ෂකයකු සුදුසුකම් ලත් උපාධියේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේ ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.
13.4. ප්‍රධාන විෂය එක් භාෂාවකිනුත් අතිරේක විෂයය තවත් භාෂාවකිනුත් සමත්වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයෙන් සාමර්ථ්‍යය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

සටහන

I. ඉහත 13.2 හා 13.3 හි ඇති "සුදුසුකම් ලත් උපාධිය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ 6.2 හි (ii) ඡේදයේ ඇති උපාධි සුදුසුකම වේ.
II. අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින ඉංග්‍රීසි විෂයය ප්‍රශ්න පත්‍රය හැර, බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම සහ පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම යන ප්‍රශ්න පත්‍ර දෙකට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
III. තම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

14. බඳවා ගැනීම් ක්‍රමය :

14.1. ලිඛිත විභාගය-
පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර තුනකින් (03) යුත් ලිඛිත විභාගයක් පවත්වනු ලබයි. අපේක්ෂකයන් විසින් විභාගයේ සියලුම විෂයයන් සඳහා පෙනී සිටිය යුතුය. එම විෂයයන් සහ එක් එක් විෂයය සමත් වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ:

| *විෂයය අංකය* | *විෂයය* | *ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* | *කාලය පැය* |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම | 100 | 40 | 2 |
| 02 | ඉංග්‍රීසි භාෂාව | 100 | 40 | 2 |
| 03 | පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම | 100 | 40 | 1 |

❖ විෂයය අංක 01 බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම විෂයය සඳහා කාලය පැය 01 බැගින් වූ ප්‍රශ්න පත්‍ර දෙකක් ඇතුළත් වේ.

14.2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය-

I. ඉහත අංක 6 යටතේ දක්වා ඇති බඳවා ගැනීම් සුදුසුකම් සපුරා තිබේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබයි. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබයි.

II. එක් එක් විෂයය සඳහා අවම ලකුණු හතළිහක් (40%) ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් අතරින් සියලු විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. එසේ සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින්, ලිඛිත විභාගයෙන් ඔවුන් විසින් ලබා ගත් කුසලතා අනුපිළිවෙළ හා බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබයි. බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාවට සමාන සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හි දී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

**සැලකිය යුතුයි.** - සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

14.3. පුරප්පාඩු සංඛ්‍යාව අනුව, සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත විභාගයේ දී ලබා ගත් ලකුණු සංඛ්‍යාව මත "ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින්" මෙම තනතුරට බඳවා ගනු ලැබේ.

14.4. ප්‍රතිඵල-

මෙම *ගැසට්* නිවේදනයේ 14.1 ඡේදය මගින් දක්වා ඇති පරිදි, අපේක්ෂකයන් විභාගයේ දී ලබා ගන්නා මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය ආගමන හා විගමන පාලක ජනරාල්වරයා වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම හෝ සිදුකරනු ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

15. ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය

01. බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම - කාලය පැය 02යි. ලකුණු 100යි.

1 වන කොටස - බුද්ධි පරීක්ෂණය

අපේක්ෂකයන්ගේ තර්කන ශක්තිය, ගණිතමය දක්ෂතා, අවබෝධය හා තීරණ ගැනීමේ හැකියාව මැනීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

2 වන කොටස - සාමාන්‍ය දැනීම

මෑත භාගයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික, සාමාජීය හා දේශපාලන තොරතුරු, ලෝක දේශපාලනය, විද්‍යාව හා තාක්ෂණ ක්ෂේත්‍රවල දැනීම හා නව විද්‍යාත්මක සොයා ගැනීම් ආදිය පිළිබඳ අරමුණු කරන ලද කෙටි හා / හෝ බහුවරණ ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි.

02. ඉංග්‍රීසි භාෂාව - කාලය පැය 02 යි. ලකුණු 100 යි.

කියවීමෙන් අවබෝධය, ප්‍රකාශන හා සන්නිවේදන හැකියාව මැනීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

03. පරිගණක විද්‍යාව පිළිබඳ මූලික දැනීම - කාලය පැය 01 යි. ලකුණු 100 යි.

පරිගණක පිළිබඳ මූලික දැනීම, MS Word, MS Excel, වැනි මෘදුකාංග භාවිතය පිළිබඳ සහ Internet, e-mail භාවිතය පිළිබඳ දැනුම මැනීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

16. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් හෝ නොගැළපීමක් වේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කළ යුතුය.

බී.එම්.ඩී. නිලූෂා බාලසූරිය,
ආගමන හා විගමන පාලක ජනරාල් (*වැ.බ.*),
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව.

2025 මාර්තු මස 27 වැනි දින,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
සුහුරුපාය,
බත්තරමුල්ල.

04-47/1

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අහදියියා දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2024-2025

ව්‍යවස්ථාව හා නිර්දේශ පත්‍රය

2023 සහ 2024 වසරවලට නියමිත අහදියියා දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාග මධ්‍යස්ථාන*:-උපලේඛනයේ - 01හි දක්වා ඇති සෑම දිස්ත්‍රික්කයක ම අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත. එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවල දී එකී නගරයේ විභාග මධ්‍යස්ථාන අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්න ව පිහිටි වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට කටයුතු කරනු ඇත.

03. *භාෂා මාධ්‍යය* :- මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. එහෙත් යම් අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලබන්නේ තමන් කැමති එක් භාෂා මාධ්‍යයකින් පමණි.

04. *සුදුසුකම්*:- මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවකු ම පහත දක්වා ඇති සුදුසුකම් අතුරින් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතුය.

4.1 මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අහදියියා දහම් පාසලක 10 වන ශ්‍රේණිය සමත් වී අහදියියා දහම් පාසල් අවසාන සහතිකපත්‍ර පන්තියේ යටත් පිරිසෙයින් වර්ෂයක් හෝ ඉගෙනුම් කටයුතුවල නිරත වීම.

4.2 ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ඉස්ලාම් ධර්මය විෂයයෙන් සමත් ව සිටීම හෝ ජොෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් ඉස්ලාම් සහ අරාබි විෂයයන්ගෙන් සමත් ව සිටීම.

**සටහන.-** මෙම විභාගය සඳහා ඉදිරිපත්වන සෑම අයදුම්කරුවකු ම ඉහත 4 වැනි ඡේදයේ සඳහන්කර ඇති සුදුසුකම්වලින් එකක්වත් සපුරා ඇති බවට මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව අනුමත කර ඇති අහදියියා දහම් පාසලක විදුහල්පතිවරයකු හෝ අරාබි විදුහලක විදුහල්පතිවරයකු විසින් හෝ සහතික කර අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

05. අයදුම් කිරීම :-

5.1 ලියාපදිංචි අහදියියා දහම් පාසල්/අරාබි විදුහල් ප්‍රධානීන් විසින් ම ඉදිරිපත් කළයුතු මෙම අයදුම්පත් තැපැල් මගින් මේ වනවිට අහදියියා දහම් පාසල්/අරාබි විදුහල් වෙත යොමුකර ඇති අතර www.doenets.lk වෙබ් අඩවිය මගින් ද බාගත කර ගැනීමේ පහසුකම් සලසා ඇත.

5.2. නව අහදියියා දහම් පාසලක්/අරාබි විදුහලක් විසින් අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සහතිකයේ පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය.

5.3 කවර හෝ අයදුම්කරුවකුට බාහිර අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. එසේ වුවත් 4 වැනි ඡේදයේ සුදුසුකම් සපුරා ඇති යම් විභාග අපේක්ෂකයකු වේ නම් තමන් පදිංචි ස්ථානයට ආසන්න අහදියියා දහම් පාසල හෝ අරාබි විදුහල මගින් රුපියල් 200 ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලුම අහදියියා දහම් පාසල්/අරාබි විදුහල් වෙත ලබා දී ඇත.

5.4 අදාළ අහදියියා දහම් පාසල්/අරාබි විදුහල් ප්‍රධානීන් විසින් ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුක්තව සකස් කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, දෙවන පිටපත අහදියියා දහම් පාසල්/ අරාබි විදුහල් ප්‍රධානීන් වෙත තබාගත යුතුය. අයදුම්පත් දෙකෙහි ම අහදියියා දහම් පාසල්/අරාබි විදුහල් ප්‍රධානීන් අත්සන් කර තිබිය යුතුය.

5.5 අයදුම්පත්වල අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් කිරීමේ දී උප්පැන්න සහතිකයේ සඳහන් ආකාරයට ම විය යුතු අතර, ප්‍රතිඵල ලබා දීමෙන් පසුව නාම සංශෝධන සඳහා කරන ඉල්ලීම්වල දී මුද්‍රණ දෝෂ හැරුණු විට වෙනත් ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ. අයදුම්පත් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. එසේ නොවන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.6 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති අහදියියා දහම් පාසලේ/අරාබි විදුහලේ පරිගණක අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු අතර, අහදියියා දහම් පාසලේ/අරාබි විදුහලේ ලිපිනය වෙනස් වී ඇත්නම් නම් එය දැන්විය යුතු අතර අහදියියා දහම් පාසලේ/අරාබි විදුහලේ විදුහල්පතිවරයා සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය ද සඳහන් කරන්න.

5.7 අයදුම්කරුවන්ගේ අදාළ සුදුසුකම් ලබාතිබීම පිළිබඳව අයදුම්පතේ සහතික කරන විදුහල්පතිවරයා හෝ ප්‍රධානීන් හෝ වගකිව යුතු ය.

5.8 අයදුම්පත් භාර ගැනීමේ දිනය **2025.04.04** දිනෙන් ආරම්භ වී **2025.05.05** දිනෙන් අවසන් වේ.

5.9 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ" යන ලිපිනයට එවිය යුතුවේ.

06. *විභාග ගාස්තු* :- මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු. 200කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ . ඌන සාමර්ථ්‍ය සම්පූර්ණ කිරීමට එක් විෂයයක් සඳහා විභාග ගාස්තුව රු.50 කි.

6.1 *විභාග ගාස්තු ගෙවීම*.- අදාළ අහදියියා දහම් පාසලේ විදුහල්පති විසින්/අරාබි විදුහලේ විදුහල්පති විසින් විභාග ගාස්තු ගෙවීමට නියමිත සියලුම අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු එකතු කර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂ අංක 20-03-02-13ට බැරවන සේ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට මුදල් ගෙවා එක් ලදුපතක් ලබාගෙන එම ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. (ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

6.2 කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයකට මාරු කිරීම හෝ ආපසු ගෙවීමක් හෝ සිදු කරනු නොලැබේ.

07. ප්‍රවේශ පත්‍ර :- විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයදුම්කරුවකු වෙත ම, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රවේශ පත්‍රයක්, අයදුම්පත් ඉදිරිපත් කළ අහදියියා දහම් පාසලේ /අරාබි විදුහල් ප්‍රධානීන් වෙත නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකුම ස්වකීය ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේ දී ම විභාග ශාලාධිපතිවරයා වෙත භාර දිය යුතුය. යම් අයදුම්කරුවකු තම ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටී නම් හෝ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයක දී විභාගයට පෙනී සිටී නම් ඔහුගේ හෝ ඇයගේ හෝ විභාග අපේක්ෂකත්වය අහෝසි කරනු ඇත.

7.2 ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, අහදියියා දහම් පාසලේ විදුහල්පති/අරාබි විදුහලේ විදුහල්පති විසින් හෝ සහතික කළ යුතුය.

7.3 විභාගය පැවැත්වීමට දින 07කට පෙර ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් එම අහදියියා දහම් පාසලේ විදුහල්පති/අරාබි විදුහලේ විදුහල්පති විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත දැන්විය යුතුය. එවැනි සෑම අවස්ථාවක ම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ කුවිතාන්සියේ ඡායා පිටපතක් සහිතව පහත සඳහන් විස්තර සැපයිය යුතුය.

- ❖ විභාගයේ නම ........................................................................................................................
- ❖ අහදියියා දහම් පාසලේ/අරාබි විදුහලේ නම ........................................................................................
- ❖ අහදියියා දහම් පාසලේ/අරාබි විදුහලේ ලිපිනය ....................................................................................
- ❖ අහදියියා දහම් පාසලට/අරාබි විදුහලට ලබා දී ඇති පරිගණක අංකය ...........................................................
- ❖ අයදුම්කරුගේ සම්පූර්ණ නම ......................................................................................................
- ❖ අයදුම් කළ විභාග මධ්‍යස්ථානය/නගරය .......................................................................................
- ❖ අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය ...................................................................................
- ❖ අයදුම්පත ලියාපදිංචි කළ කුවිතාන්සිය .......................................................................................
- ❖ විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම ලදුපත .......................................................................................

08. *අනන්‍යතාව* :- විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

- ❖ ජාතික හැඳුනුම්පත,
- ❖ වලංගු විදේශ ගමන් බලපත්‍රය,
- ❖ වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව සනාථ කරගත හැකි පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

09. සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම:-

මෙම විභාගය සඳහා නියමිත විෂයයන් ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමාර්ථය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකු ම එම විෂයයන් හතරෙන් ම සමත් විය යුතුය. කෙසේ වෙතත් එක් වතාවක දී අදාළ විෂයය හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී ඉදිරි වර්ෂ තුනක් (03) ඇතුළත දී එම ඌන සාමාර්ථය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමාර්ථය සම්පූර්ණ කළ යුතුය. ඌන සාමාර්ථය ලබන සිසුන් ඌන සාමාර්ථය සම්පූර්ණ කිරීමේ දී විභාගයට පෙනී සිටිය යුත්තේ අනිවාර්යයෙන් ම ඌන සාමාර්ථය ලැබූ විෂයට පමණි.

9.1 සෑම විෂයයක ම එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100ක් හිමිවන අතර, සමත්වීමේ ශ්‍රේණිවලට අදාළ ලකුණු පරාස සහ සංකේත පහත දැක්වේ :-

| *ලකුණු පරාසය* | *ශ්‍රේණිය* | *සංකේතය* |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ට සම්මාන | D |

9.2 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තුව අදාළ අහදියියා දහම් පාසලේ විදුහල්පති/අරාබි විදුහලේ විදුහල්පති වෙත තැපැල් මගින් එවනු ලැබේ.

10. *සහතික පත්‍ර* :- මෙම විභාගයෙන් සමත්වන සෑම අයදුම්කරුවකුට ම විභාග දෙපාර්තමේන්තුව මගින් සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ. අදාළ සහතික පත්‍ර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ලබා දෙනු ඇත. උක්ත විභාගය සමත් ව එහෙත් සහතික පත්‍රයක් නොලැබුණ යම් අපේක්ෂකයකු වේ නම්, ඒ පිළිබඳ අහදියියා දහම් පාසල් විදුහල්පති මගින් හෝ අරාබි විදුහලේ විදුහල්පති මගින් “විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග ප්‍රතිඵල ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ” යන ලිපිනයට ලිපියක් මගින් විමසීම් කළ යුතුය.

11. *උත්තර පත්‍ර නැවත සමීක්ෂණය* :-අහදියියා දහම් පාසල් විදුහල්පති/අරාබි විදුහලේ විදුහල්පතිගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින්, විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30 ක් ඇතුළත නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා වන ගාස්තු ප්‍රමාණයන් වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩදෙනු නොලැබේ.

12. *විභාගය පිළිබඳ විස්තර* :-මෙම විභාගය ප්‍රශ්න පත්‍ර හතරකින් (04) සමන්විත වේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාළ කාලය පැය තුනක් (03) බැගින් වේ. එම ප්‍රශ්න පත්‍ර පහත දැක්වේ :

01. ඉස්ලාමීය සිද්ධාන්ත හා මූලිකාංග (අල් අකීදා වෂ්ෂරීආ) සහ අරාබි භාෂාව
02. ඉස්ලාමීය නීති පද්ධතිය (අල් ෆික්හුල් ඉස්ලාම්)

03. ඉස්ලාමීය ඉතිහාසය (අස්සීරා වත්තාරික්)
04. ඉස්ලාමීය සාරධර්මය (අල් අඛ්ලාක්)

13. විෂයය නිර්දේශය :-
අහදියියා දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගයට අදාළ විෂය නිර්දේශය උපලේඛනය - 02 ලෙස මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇත.

14. මූලාකෘති ප්‍රශ්න පත්‍ර :-
මූලාකෘති ප්‍රශ්න පත්‍ර සඳහා "අධ්‍යක්ෂ, මුස්ලිම් ආගමික හා සංස්කෘතික දෙපාර්තමේන්තුව, අංක 180, ටී. බී. ජයා මාවත, කොළඹ 10. යන ලිපිනයෙන් හෝ 011-2667909/011-2669994 විමසන්න.

15. මෙම ව්‍යවස්ථාව සහ විෂයය නිර්දේශ පත්‍රයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ අභිමත පරිදි තීරණය වනු ඇත.

16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර,
විභාග කොමසාරිස් ජනරාල්.

2025 අප්‍රේල් මස 04 වැනි දින,
බත්තරමුල්ල, පැලවත්ත,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

උපලේඛනය - 01

| *දිස්ත්‍රික් අංකය* | *නගර අංකය* | *නගරයේ නම* |
|---|---|---|
| 01 - කොළඹ | 101 | මරදාන |
| | 102 | බම්බලපිටිය |
| 02- ගම්පහ | 201 | මීගමුව |
| | 202 | නිට්ටඹුව |
| 03-කළුතර | 301 | කළුතර |
| | 302 | පානදුර |
| | 303 | අලුත්ගම |
| 04-මහනුවර | 401 | මහනුවර |
| | 402 | නාවලපිටිය |
| 05-මාතලේ | 501 | මාතලේ |
| 06-නුවරඑළිය | 601 | නුවරඑළිය |
| | 602 | හැටන් |
| 07-ගාල්ල | 701 | ගාල්ල |
| 08-මාතර | 801 | මාතර |
| | 802 | අකුරැස්ස |
| 09-හම්බන්තොට | 901 | හම්බන්තොට |
| | 902 | වීරකැටිය |
| 10-යාපනය | 1001 | යාපනය |
| 11-මන්නාරම | 1101 | මන්නාරම |
| 12-වව්නියාව | 1201 | වව්නියා |

| දිස්ත්‍රික් අංකය | නගර අංකය | නගරයේ නම |
|---|---|---|
| 13-මුලතිව් | 1301 | මුලතිව් |
| 14-කිලිනොච්චිය | 1401 | කිලිනොච්චිය |
| 15-මඩකලපුව | 1501 | කාත්තන්කුඩි |
| | 1502 | වාලච්චේන |
| | 1503 | එරාවූර් |
| 16-අම්පාර | 1601 | අම්පාර |
| | 1602 | සමන්තුරේ |
| | 1603 | ඉරක්කාමම් |
| | 1604 | පොතුවිල් |
| | 1605 | කල්මුනේ |
| | 1606 | නින්තවූර් |
| | 1607 | අක්කරෙපත්තු |
| 17-ත්‍රිකුණාමලය | 1701 | ත්‍රිකුණාමලය |
| | 1702 | මූතූර් |
| | 1703 | කින්නියා |
| 18- කුරුණෑගල | 1801 | කුරුණෑගල |
| | 1802 | නාරම්මල |
| | 1803 | කුලියාපිටිය |
| | 1804 | සියඹලාගස්කොටුව |
| 19-පුත්තලම | 1901 | පුත්තලම |
| | 1902 | මදුරන්කුලිය |
| | 1903 | නොරොච්චෝලය |
| | 1904 | හලාවත |
| 20-අනුරාධපුරය | 2001 | අනුරාධපුරය |
| | 2002 | කැකිරාව |
| | 2003 | හොරොව්පොතාන |
| 21-පොළොන්නරුව | 2101 | පොළොන්නරුව |
| | 2102 | කදුරුවෙල |
| 22-බදුල්ල | 2201 | බදුල්ල |
| | 2202 | හාලිඇල |
| | 2203 | බණ්ඩාරවෙල |
| | 2204 | වැලිමඩ |
| 23-මොනරාගල | 2301 | බිබිල |
| 24-රත්නපුර | 2401 | රත්නපුර |
| | 2402 | ඇහැලියගොඩ |
| | 2403 | රක්වාන |
| 25-කෑගල්ල | 2501 | මාවනැල්ල |
| | 2502 | වරකාපොල |
| | 2503 | කන්නන්තොට |

උපලේඛනය - 02

පළමුවන ප්‍රශ්න පත්‍රය :

1. ඉස්ලාමීය සිද්ධාන්ත හා මූලිකාංග අල් අකීදා වෂ්ෂරීආ සහ අරාබි භාෂාව

1.1. අකීදා පොදු පැහැදිලි කිරීම් (අල් ඉලාහියියාත්, අන්නුබුව්වත්, අර්රුහානියත්, අස්සම් ඉය්යාත්)

1.2. අකීදාවේ කොටස්
- + අහුලුස්සුන්නා වල්ජමා අත්හි අකීදා
- + අනිකුත් අකීදා කොටස් කිහිපයක් : ජබරිය්යා, කදරිය්යා, මුර්ජියා, මුඃතසීලා, ෂියා

1.3. තෞහිද් හා ෂිර්ක්කු
- + ඊමාන් හා කුෆ්රු
- + රිද්දත්, නිෆාක්
- + අල්කුර්ආණය පහල කර එය සම්පාදනය කරන ලද ආකාරය පිළිබඳ ඉතිහාසය
- + නීති මූලධර්මයන් වශයෙන් අල්කුරාණයේ උපයෝජනය
- + සුන්නාවේ බිහිවීම හා එය සම්පාදනය කළ ඉතිහාසය
- + නෛතික මූලධර්ම වශයෙන් සුන්නාවේ උපයෝජනය
- + හදීස් කලා ඉතිහාසය හා ප්‍රධාන මුහද්දීස්වරුන්ගේ දායකත්වය
- + ඉජ්තිහාද් පිළිබඳ විස්තර
- + ආධාරක මූලධර්මයන් වශයෙන් ඉජ්මා
- + ආධාරක මූලධර්මයන් වශයෙන් කියාස්
- + ෆික්හයේ ඉතිහාසය හා ප්‍රධාන ඉමාම්වරු

1.4. අරාබි භාෂාව
- + හැඩහුරු සහිතව ලිවීම
- + කුඩා වාක්‍යයන් ලිවීම
- + ඉස්ලාම් විෂයයට අදාළ අරාබි වචන ලිවීම
- + ප්‍රධාන සූරා, ආයත්, හදීස් ආදිය නිවැරදිව ලිවීම

දෙවන ප්‍රශ්න පත්‍රය :

02. ඉස්ලාමීය නීති පද්ධතිය (අල් ෆිල්හුල් ඉස්ලාම්)

2.1. ඉබාදත් පිළිබඳ විස්තර
- + ඉබාදතයේ කොටස්
- + තහාරත්

2.2. නජීසය හා එහි කොටස්
- + නජීසය පිරිසිදු කිරීමේ ක්‍රම
- + ජලය හා එහි වර්ග
- + වුලු, තයම්මුම්, ස්නානය පිළිබඳ පවතින ක්‍රියාදාමයන්

2.3. සකාත්
- + වැදගත්කම
- + විධි හා ක්‍රම
- + එක්රැස් කිරීම හා බෙදාහැරීම
- + සකාත් මගින් දිළිඳුකම තුරන් කිරීම සහ සම්පත් බෙදීම

2.4. නෝම්බිය (උපවාසය)
- + වැදගත්කම
- + විධි ක්‍රම හා ප්‍රයෝජන

2.5. හජ්
- + වැදගත්කම
- + විධි ක්‍රම හා ප්‍රයෝජන

2.6. හජ් ඉටුකරන ක්‍රම
- + පරලු, වාජිබ්, සුන්නත්
- + පරලු හජ් යට අමතරව ඉටුකරන හජ්

2.7. ඉස්ලාම් හි ආහාර, ඇඳුම්, වාසස්ථාන පිළිබඳ අවධානය හා ක්‍රියාදාම

2.8. ජිහාත් පිළිබඳ පැහැදිලි කිරීම

2.9 කුර්බානි හා කැපුම් ක්‍රමයන්

2.10. දිව්රුම් හා භාරවීම

2.11 මුආමලාත් පිළිබඳ විස්තර
- + ඉපයීමේ වැදගත්කම
- + ප්‍රධාන ගනුදෙනු (වෙළඳාම)
- + අනිකුත් ගනුදෙනු (උදා:- තාවකාලිකව ඉල්ලා ගැනීම, බදු ගැනීම)
- + වක්පු, වසීය්යත්, වරාසත් (පොදු දේපළ, මුදල් දේපළ, පරම්පරා දේපළ)

2.12 ඉස්ලාම් හි ස්ත්‍රී, පුරුෂ තත්ත්වයන්
- + නිකායේ විධි හා ප්‍රයෝජන
- + පවුල් ජීවිතය
- + අඹුසැමියන්
- + දෙමාපිය, දූ දරු අයිතිවාසිකම් හා යුතුකම්
- + තලාක් හා ඉද්දා

2.13. ජිනායත්
- + හුදූද්, කියාස්, තඃසීර්

තුන්වන ප්‍රශ්න පත්‍රය :

03. ඉස්ලාමීය ඉතිහාසය (අස්සීරා වත්තාරික්)

3.1.1. නබි (සල්) තුමා
- + නුබුව්වතයට පෙර ජීවිතය
  - පවුල, පරම්පරාව
  - තරුණ විය
  - උතුම් ගුණාංග
  - විවාහය
- + නුබුව්වත් හා හිජ්රත් අතර ජීවිතය
  - නුබුව්වත් ලැබීම
  - ඉස්ලාමීය ප්‍රචාරයන් හා එහි ප්‍රතිඵල
  - මිඃරාජ්
  - හිජ්රත්

+ මදීනා ජීවිතය
    - සමාජ දේශපාලන ක්‍රියාකාරකම්
    - ආත්මාරක්ෂා යුද්ධයන් හා සාම ගිවිසුම්
    - ඉස්ලාම් සම්පූර්ණ වීම
    - සහාබාවරුන්ගේ තත්ත්වයන් හා ඉස්ලාමය වෙනුවෙන් එතුමන්ලාගේ දායකත්වයන්
    - කුලපාඋර්රා සීදූන් යන අයගේ ඉතිහාසය හා දේශපාලන දායකත්වය
    - උමය්යා, අබ්බාසිය්යා පාලන කාලය
    - බයිතුල් මුකද්දසයේ ඉතිහාසය
    - ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා දායකත්වය
    - පහත සඳහන් අය පිළිබඳ ඉතිහාසය
        * ඉමාම් බුහාරි (රහ්)
        * ඉමාම් ෂාපිර් (රහ්)
        * ඉමාම් ගස්සාලි (රහ්)
        * ඉමාම් අබ්දුල් කාදර් පිලාන් (රහ්)
        * ඉමාම් ෂාදුලි (රහ්)

හතරවන ප්‍රශ්න පත්‍රය :

0. ඉස්ලාමීය සාරධර්මය (අල් අහ්ලාක්)

4.1. අක්ලාක් පිළිබඳ ඉස්ලාමයේ අවධානය
  + අක්ලාක් පිළිබඳ විස්තර
  + ඊමාන් සහ අක්ලාක් අතර පවතින සම්බන්ධතාවය
  + අක්ලාක් හා ඉබාදත් අතර තිබෙන සම්බන්ධතාවය
  + හෘද පවිත්‍රත්වය (ඉක්ලාස්)

4.2. තක්වා
  + වරඋසුහ්ද්
  + මුරාකබා, මුහාසබා
  + ෂවුක් (දේව කරුණාව)

4.3. දන්දීම
  + කැපවීම
  + කෘතඥභාවය
  + ඉවසීම, හික්මීම, ඉඩදීම, සමාවීම
  + බැගෑපත්වීම
  + කාලය අගය කිරීම
  + අවයවයන් රැකගැනීම කට, ඇස, කණ, ලිංගික අංගයන්
  + අන් අයට ගෞරව කිරීම
  + යුක්තිය හා අවංකභාවය
  + තරුණ තරුණියන් අතර දක්නට ලැබිය යුතු වැදගත් සදාචාර ගුණාංගය
  + අනිකුත් ආගමික අය අතර වූ සහජීවනය

4.4. ඉස්ලාමීය නීති පද්ධතිය

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2025 වර්ෂය** | | | |
| **අප්‍රේල්** | 2025.04.04 | සිකුරාදා | 2025.03.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.04.11 | සිකුරාදා | 2025.03.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.04.17 | බ්‍රහස්පතින්දා | 2025.04.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.04.25 | සිකුරාදා | 2025.04.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මැයි** | 2025.05.02 | සිකුරාදා | 2025.04.17 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2025.05.09 | සිකුරාදා | 2025.04.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.05.16 | සිකුරාදා | 2025.05.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.05.23 | සිකුරාදා | 2025.05.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.05.30 | සිකුරාදා | 2025.05.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජුනි** | 2025.06.06 | සිකුරාදා | 2025.05.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.06.13 | සිකුරාදා | 2025.05.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.06.20 | සිකුරාදා | 2025.06.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.06.27 | සිකුරාදා | 2025.06.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2025 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.